# 28

# අජ්නබි මහ්රම් සීමා

අල්ලාහ් ජීවීන්, ස්ත්‍රී පුරුෂ යන යුගල වශයෙන් මවා ඇති සේ ම මානව සංහතිය ද එලෙස ම මවා ඇත. පළමු මිනිසා ලෙස පුරුෂයකු මැවූ අල්ලාහ් ඔහුගේ සහායට කාන්තාව ද මැවුවේ ය. එතැන් සිට මිනිස් සංහතියේ මෙම ලිංග දෙකෙන් එකකට අයත් වන සේ ස්ත්‍රීහු සහ පුරුෂයෝ බිහි වූහ. මිනිසුන් අතර ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා ශිෂ්ට සම්පන්න විය යුතු ය, යන්න ඉස්ලාමයේ ප්‍රතිපත්තිය වේ. එබැවින්, මෙම දෙපාර්ශ්වය අතර ඇති වන ආකර්ෂණය මිනිසාගේ හැඟීම්වල ද,  විනයානුකූල ගුණාංගවල ද සමාජ ආරක්ෂාවෙහි ද ඉතා වැදගත් දෙයකි. එබැවින්,  ඒ සඳහා වූ පිළිවෙළ ඉස්ලාම් ඉතා පැහැදිලි ව විස්තර කර දී ඇත.

නිරෝගීමත් සමාජයක ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා විධිමත් ව පවතී. එහි කාන්තාවන්ට හිමි ගෞරවය හා ආරක්ෂාව යහපත් වේ. සැමියා - බිරිඳ, මව - දරුවා, සහෝදරයා - සහෝදරිය යන ඥාතිත්වයන් පැහැදිලි සීමාවකින් රැක ගත යුතු ය. මහ්රම් යන අරාබි පදය මඟින් විවාහ සම්බන්ධතා පවත්වා ගැනීමට තහනම් කළ අය ද, අජ්නබී යන පදය මගින් විවාහ සම්බන්ධතා පවත්වා ගැනීමට අනුමත කළ අය ද හඳුන්වා දෙනු ලබයි. මෙම තත්ත්වයන් දෙක පෙර සමාජ අතර ද, මුස්ලිම් නොවන අනෙකුත් සමාජ අතර පවා ද දක්නට ලැබේ. එනමුත්, ඉස්ලාමයේ එහි වර්ග ද සීමා ද විස්තරාත්මකව හා ගැඹුරින් විස්තර කර ඇත.

මේ පිළිබඳව සූරා අන් නිසාහි 23 වැකියෙහි පහත සඳහන් පරිදි විස්තර කර ඇත. **"තොපගේ මවුවරුන් ද, තොපගේ දියණියවරුන් ද, තොපගේ සහෝදරියන් ද, තොපගේ පියාගේ සහෝදරියන් ද, තොපගේ මවගේ සහෝදරියන් ද, (තොපගේ ) සහෝදරයාගේ දූවරුන් ද, සහෝදරියගේ දූවරුන් ද, තොපට කිරි පෙවූ මවුවරුන් ද, කිරි පෙවීමෙන් වූ සහෝදරියන් ද, තොප භාර්යාවන්ගෙන් උපන්නා වූ ද, තොප යටතේ තොප ඇති දැඩි කළා වූ ද, ස්ත්‍රීන්  පාවා ගැනීම තොප කෙරෙහි හරාම් (තහනම්) කරන ලදී.** ( 4-23)

ඉහත සඳහන් කරන ලද අල් කුර්ආන් වැකි ද, ඒ හා සම්බන්ධ අනෙකුත් වැකි ද, හදීස් ද පදනම් කර ගෙන අජ්නබි මහ්රම් යන සබඳතාව පහත ආකාරයට වගුගත කළ හැකි ය.

| මහ්රම් වර්ගය | ඥාති වර්ගය | මහ්රම් වන කාලය |
|---|---|---|
| පවුල් නෑකම | • මව, මවගේ මව<br>• දියණිය, ඇයගේ දියණිය, පුත්‍රයාගේ දියණිය<br>• සහෝදරිය ( එක කුස උපන්, මව් පාර්ශ්වයෙන් හා පිය පාර්ශ්වයෙන්)<br>• පියාගේ මවගේ සහෝදරියන්<br>• සහෝදරයාගේ හා සහෝදරියගේ දූවරු | ස්ථිර ය |
| විවාහයෙන් | • බිරිඳගේ මව, මවගේ මව<br>• බිරිඳගේ දියණිය, දියණියගේ දියණිය<br>• පියාගේ බිරිඳ, සීයාගේ බිරිඳ<br>• පුතාගේ බිරිඳ, මුණුපුරාගේ බිරිඳ | ස්ථිර ය |
| | • බිරිඳගේ සහෝදරිය<br>• බිරිඳගේ මවගේ හා පියාගේ සහෝදරියන් | තාවකාලික ය |
| කිරි නෑකම | • කිරි පෙවූ මව, මවගේ මව<br>• කිරි නෑකමෙන් දුව, දුවගේ දුව.<br>• කිරි නෑකමේ සහෝදරිය (එක් කුසේ උපන්)<br>• කිරි පෙවූ මවගේ පියාගේ මවගේ සහෝදරිය සහ පියාගේ සහෝදරිය.<br>• කිරි නෑකමේ සහෝදරයාගේ හා සහෝදරියගේ දියණියන්. | ස්ථිර ය |

ෂරීආව මගින් සීමා කරන ලද ඉහත පවසන ලද සමහර අය විවාහ කර ගැනීම ස්ථිර වශයෙන් ද, තවත් සමහර අය විවාහ කර ගැනීම තාවකාලික වශයෙන් ද තහනම් කර ඇත. විවාහ වීමට තාවකාලික ව තහනම් කරන ලද හේතුව ඉවත් ව ගිය පසු එම තහනම ද ඉවත් වේ.

ඉහත සඳහන් කරන ලද ඥාතී ක්‍රම එක් පුරුෂයෙකුට තහනම් කර ඇති සේ ම, එයට සමාන්තර වූ පුරුෂ ඥාතීත්ව සබඳතා කාන්තාවකට ද තහනම් වේ. ඒ අනුව ස්ථිර වශයෙන් තහනම් කරන ලද අය හැර අන් අය සමග කාන්තාවක තම රූප අලංකාරත්වය එළි දැක්වීම ද, ඔවුන් සමග තනිව ගමන් කිරීම ද, තහනම් කරනු ලැබ ඇත.

එබැවින් අපි සීමාවන් රැකගෙන හැසිරීමෙන් විනයගරුක සමාජයක් ගොඩ නැගීමට උත්සාහ කරමු.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

أَجْنَبِي مَحْرَمِي حَرَامٌ

**අභ්‍යාස**

හරි නම් (හරි) යනුවෙන් ද, වැරැදි නම් (වැරැදි) යනුවෙන් ද ලියන්න.

1. විවාහය සඳහා තහනම් කරනු ලැබූ අය අජ්නබී යනුවෙන් හැඳින් වේ. ( )
2. මවගේ සහෝදරිය විවාහ කර ගැනීම ඉස්ලාම් ස්ථිර ලෙස තහනම් කර ඇත. ( )
3. පුරුෂයෙකුට තම බිරිඳ සමග ඇයගේ සහෝදරිය ද විවාහ කර ගැනීම වරදක් නොවේ. ( )
4. පවුලේ නෑකම් මඟින් තහනම් වන අය කිරි බීමෙන් ද තහනම් වේ. ( )
5. කාන්තාවකට තම සහෝදරියගේ සැමියා සමග තනිව ගමන් කිරීම වරදක් නොවේ. ( )